ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2021,2022 සහ 2023

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2021,2022 හා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ තුන සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ආසන්න වර්ෂ 05ක මූල්‍ය ප්‍රකාශන වර්ෂ කිහිපයක් ප්‍රමාදවී විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණු අතර 2021, 2022 හා 2023 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා 2024 දෙසැම්බර් 30 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම

මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද, වාර්තාවේ සඳහන් වර්ෂයන්ට අදාළ ලෙජර් ගිණුම්, පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙළ කරන ලද 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වත්කම්	**වටිනාකම (රු.)**
ජංගම නොවන වත්කම්	1,963,257,721
ජංගම වත්කම්	948,969,760
මුළු වත්කම්	**2,912,227,482**
බැරකම්	
ජංගම බැරකම්	2,953,451,992
ජංගම නොවන බැරකම්	883,608,025
මුළු බැරකම්	**3,837,060,017**
ශුද්ධ වත්කම් / අයිතිය	(924,832,535)
මුළු ආදායම	1,129,930,153
මුළු වියදම	(1,478,322,769)
ඌනතාවය	**(348,392,616)**

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

	නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව.	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය	මුදල් වර්ෂය ආරම්භවීමට දින 15කට කළින් ආයතනය සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබද දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත්, 2021 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම විගණනයට ඉදිරිපත් කරනු ලැබුවේ 2021 දෙසැම්බර් 15	2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළ ක්‍රියාකාරී සැලසුම් ආයතනය විසින් පිළියෙල කර ඇති අතර විගණනය වෙත එම වර්ෂවල ක්‍රියාකාරී සැලසුම් හැකි ඉක්මනින් ලබාදිමට කටයුතු කරනු ඇත.	ක්‍රියාකාරී සැලැස්ම නියමත දිනට නියමිත ආකෘතිය ප්‍රකාරව සකස්කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කල යුතුය.

		දිනදීය. 2022 සහ 2023 වර්ෂයන්ට අදාලව ක්‍රියාකාරී සැලැසුම් 2023 දෙසැම්බර් 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.		
(ආ)	2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 වගන්තිය	ආයතනයක් විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ලගාකර ගනිමින් ව්‍යාපාරය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වන අතර එසේ සකස් කරනු ලබන සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, ජනතා වතු සංවර්ධන මණ්ඩලය 2021, 2022 සහ 2023 වර්ෂයන් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	ව්‍යාපාර සැලැස්ම සකස් කිරිම සඳහා සහ ගෙවීම් කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබු බැවින් අදාළ කටයුතු සිදුකිරිමේදි ගෙවීම් කටයුතු ඒ අනුව සිදුකර ඇත.	මණ්ඩලය සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කර අදාල අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2006 ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය මගින් නිකුත්කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 වගන්තිය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය නොකර 2022 – 2024 කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපාර සැලැස්ම සකස් කිරීමට 2021 දෙසැම්බර් 21 දින පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී මණ්ඩලය විසින් මෙම සේවාව වෙනුවෙන් 2021 දෙසැම්බර් සිට 2022 මැයි දක්වා රු.2,025,000ක් ගෙවා තිබුණි.එම ආයතනය විසින් සකස් කළ වාර්තාව තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි අරමුණු හා කාර්යයන් ඇතුළත් වීම හේතුවෙන් වැවිලි අමාත්‍යාංශය විසින් එය අනුමත කර නොතිබුණි. මෙම වාර්තාව 2023 වර්ෂය අවසන් වන විටද	ආයතනය මූල්‍ය අර්බුදයක සිටි බැවින් කොවිඩ් කාලය තුල කාරක ප්‍රග්ධන අවශ්‍යතාවයන් සඳහා බැංකු ණයක් කඩිනමින් ලබාගැනීම සඳහා සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කළයුතුව තිබු අතර එකී අවශ්‍යතාව සඳහා බාහිර පාර්ශ්වයකට ලබාදී සැලසුම සකසා රේඛිය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.එහි යම් යම් අඩුපාඩු තිබු බැවින් එය සකස් කර නැවත ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශය දැනුම් දී ඇත.එකී සංයුක්ත සැලැස්ම අනුව ක්‍රියාකාරී සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සේවා ඉටු කරවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත , පළපුරුදු ආයතනයක් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය.

		ක්‍රියාත්මක කර නොතිබූ අතර, ඒ වෙනුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත් වි තිබුණි.එසේම මෙම කාර්යට අදාළ වර්තමාන තත්ත්වය විගණනයට ඉදිරිපත් නොවීය.		
(ඇ)	2020 ජනවාරි 27 දිනැති මුදල් , ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ අංක PED 01/2020 දරන චක්‍රලේඛයේ 1.2 ඡේදය	සභාපතිවරයකු වෙත නිල වාහනයක් හෝ මාසික ප්‍රවාහන දීමනාව යන දෙකෙන් එකක් පමණක් හිමි වුවද, සභාපතිවරයා වෙත නිල වාහනයක් ලබා දෙමින් 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා ප්‍රවාහන දීමනා ලෙස රු.මිලියන 2.35 ක් මණ්ඩලය වෙතින් ගෙවීම්කර තිබුණි. එමෙන්ම සභාපතිවරයා වෙත මසකට හිමි ඉන්ධන ප්‍රමාණය ලීටර් 150 ක් වුවද මීට අමතරව තවත් ඉන්ධන ලීටර් 100 ක් ඇතුළුව ඉන්ධන දීමනාව ලෙස රු.50,000ක ලබා දීම සඳහා 2020 දෙසැම්බර් 11 දිනැති 9 වෙනි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. මෙම ඉන්ධන දීමනාව මාසිකව ඔහු ලබා ගන්නා සභාපති දීමනාව සමඟ ලබා ගෙන තිබුණි. කෙසේ වුවද 2020 මාර්තු මාසයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා චක්‍රලේඛයේ අනුමත ඉන්ධන සීමාව ඉක්මවා රු.1,819,131 ක් වටිනා ඉන්ධන ලීටර 7,491.16 ක් සභාපතිවරයා විසින් භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය.	2020 ජනවාරි මස සිට 2020 නොවැම්බර් වන තෙක් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/01/2015 අනුව සභාපතිතුමාගේ ඉන්ධන සඳහා ගෙවීම් සිදුකර ඇත. 2020 සිට 2023.12.31 දක්වා ඉන්ධන දීමනාව රු. 50,000/- ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීම් සිදුකර ඇති අතර, එම අධ්‍යක්ෂ මණ්ඩල තුළ මුදල් අමාත්‍යාංශයේ නියෝජනය හා එවකට පැවැති රේඛිය අමාත්‍යාංශයේ නියෝජනයක් තිබුණි. ප්‍රධාන කාර්යාලයේ සිට එක් එක් වතුයායන්ට අදාළ දුර ප්‍රමාණය සියළු වතු යායන් වලට වතුයාය තුල ගමන් කිරීමද ඇතුළුව,ගමන් කිරීමේදී එක් වරක් යාමට හා ඒම සඳහා දුර ප්‍රමාණය 7476 km කි.සභාපති ලබාගෙන ඇති ඉන්ධන වියදම 1,819,131ක මුදල සාමාන්‍ය අගයක් වනු ඇත.	චක්‍රලේඛයට පටහැනිව නිල වාහනයක් හා ප්‍රවාහන දීමනා යන පහසුකම් දෙකම ලබාදීම සඳහා හා නිසි අනුමැතියකින් තොර අමතර ඉන්ධන සඳහා ගෙවීම් නිර්දේශකල ,අනුමත කළ නිළධාරීන්ට එරෙහිව වහාම පියවර ගතයුතු අතර එම වැඩිපුර ගෙවීම් අදාල නිළධාරියාගෙන් අයකර ගැනීමට නොපමාව කටයුතු කල යුතුය.
(ඉ)	2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 සහ 3.1 ඡේද	චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ව්‍යවසායක සභාපති, ප්‍රධාන විධායක නිළධාරි, කළමණාකාර අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රධාන මූල්‍ය නිළධාරි, ප්‍රධාන මෙහෙයුම්	ජනතා වතු සංවර්ධන මණ්ඩලය පිහිටවූ 1972 අංක 11 දරන කෘෂිකාර්මික පණතේ විධිවිධානයන්ට අනුකූලව මෙම ආයතනයේ එකී නිළධාරීන් සඳහා ප්‍රවාහන දීමනාව ලබාදීමට	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන හා ප්‍රවාහන දීමනා ගෙවීම් කළ යුතු අතර අවශ්‍ය සංශෝධනයන්

		නිළධාරි සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර ඇති HM 1-1 ගණයේ හෝ ඊට ඉහළ මට්ටමේ තනතුරක් දරන ඕනෑම නිළධාරියෙකුට නිල වාහනයක් ලැබීමට සුදුසුකම් ලැබෙන බවත් නිල වාහන හිමි නිළධාරීන්ට අදාල ඉන්ධන දීමනා හිමි වුවද මණ්ඩලය විසින් මෙම චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි 2021 හා 2022 වර්ෂයන්හි දී ඉන්ධන හා ප්‍රවාහන දීමනා හිමිකම් නොමැති නිලධාරීන් 16ක් වෙත පිළිවෙලින් රු.මිලියන 8.6 හා රු.මිලියන 12.3 ක් ගෙවීම් කර තිබුණි. එසේම 2023 වර්ෂයේ නිලධාරීන් 11 ක් වෙත ද ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස රු.මිලියන 10.25 ක් මණ්ඩලය විසින් ගෙවීම් කර තිබුණි. එසේම ඉන්ධන හා ප්‍රවාහන දීමනා හිමිකම් නොමැති තනතුරු වලට නිළධාරීන් බඳවා ගැනීමේදී පත්වීම් ලිපියේ එම දීමනා ගෙවන බව සඳහන් කර තිබූ අවස්ථාද නිරීක්ෂණය විය.	ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු කර ඇත. එකී පණතේ 5.b, 5.e, 8.8 (1) (b), 8.1 (b) උප වගන්තිය යටතේ එවැනි තීන්දු තීරණ ගැනීමේ හැකියාවක් මෙම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හිමි වී ඇත. තවද මෙම නිළධාරීන්, සභාපති,අධ්‍යක්ෂ මණ්ඩලය හා සාමාන්‍යාධිකාරී තනතුර හැර වෙනත් කිසිදු තනතුරක් ඇතුලත්ව නොතිබීම නිසා මෙම නිළධාරීන්ගේ තනතුරට අදාල රාජකාරීන්ගේ ස්වාභාවය මත එයට පැවරී තිබූ රාජකාරීන්වලට අමතරව එකී තනතුරු සීමාවෙන් ඔබ්බට වූ ඉහල රාජකාරී ඉටුකිරීමට සිදුවී ඇත. මෙයට අමතරව මෙම දීමනා ගෙවන නිළධාරීන්ගෙන් කිහිපදෙනෙකුගේම පත්වීම් ලිපිවල ඔවුන්ට මෙම දීමනා ලබාදෙන බවට කොන්දේසි ඇතුලත් කොට ඇත. පත්වීම් ලිපියට අදාලව සේවක දීමනා ලබාදීමට සේවායෝජිත බැඳී සිටින අතර පත්වීම් ලිපිය ප්‍රකාරව එම නිළධාරීන්ට ගෙවීම් කර ඇති අතර එම ශ්‍රේණියේම අනෙකුත් නිළධාරීන්ට ඇතිවන විෂමතා වැලැක්වීමට අනෙකුත් නිළධාරීන්ට මෙම දීමනාව ලබාදී ඇත.	චක්‍රලේඛනයේ සඳහන් පරිදි අනුමැතීන් මත සිදුවිය යුතුය.
(ඊ)	2010 පෙබරවාරි 03 දිනැති අංක SP/RD/02/10 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ 7 ඡේදය	රජයට ලැබිය යුතුව ඇති ඉඩම් ආදායම් නිසි පරිදි අයවන බවට සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතු අතර රජයේ ඉඩම් බදුදීම, විකිණීම හා දීමනා පත්‍රයක් මඟින් බැහැර කිරීමේ දී වටිනාකම/ බදු මුදල් අය කිරීම	ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන් වෙත බදු පදනම මත ලබා දී ඇති ඉඩම් හා ගොඩනැගිලි 193 ක් වන අතර, 115 ක් බදු ගිවිසුම් ක්‍රියාත්මක තත්වයේ පවතී. ඉන් සමහරක් ඉඩම් හා	රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම අනුව ඉඩම් හා ගොඩනැගිලි බදුදීම හා බැහැරකිරීම සිදුකල යුතු අතර

	රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ලබා ගන්නා තක්සේරුව මත පදනම් කර ගෙන සිදු කළ යුතු වුවද, ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන් වෙත බදු පදනම මත හෝ කුලී පදනම මත ලබා දුන් ඉඩම් හා ගොඩනැගිලි ප්‍රමාණය 93ක් අතුරින් ඉඩම් හා ගොඩනැගිලි 62 ක් සඳහා තක්සේරු වාර්තා සකස් කර බදු දී නොතිබුණි.එසේම එම ඉඩම් හා ගොඩනැඟිලි සඳහා නියමිත පරිදි බදු අයකිරීමද සිදුවී නොතිබුණි.	ගොඩනැගිළි බදු දෙන අවස්ථාවේම රජයේ තක්සේරු වාර්තා ලබාගෙන ඇති අතර, සමහර ඉඩම් සඳහා පසුව රජයේ තක්සේරු වාර්තා ලබාගෙන ඇත. තක්සේරු වාර්තා ලබාගෙන නොමැති ඉඩම් හා ගොඩනැඟිළි සඳහා රජයේ තක්සේරු වාර්තා ඉල්ලුම් කර ඇත. තක්සේරු වාර්තා මත බදු මුදල් වැඩි කිරීමට අවශ්‍ය කොන්දේසි ඇතුළත්ව නොමැති බදු ගිවිසුම් 32 ක් ඇත. එම කොන්දේසි නොමැති ගිවිසුම් සඳහා රජයේ තක්සේරුව යොදාගෙන බදු අය කළ නොහැක.නියමිත ලෙස බදු අයකිරීම් කළ නොහැකිව ඇත්තේ නඩු කටයුතු පවතින බදු ගිවිසුම් සම්බන්ධයෙන් වනු ඇත.	අදාළ බදු ගිවිසුම් විධිමත් පරිදි සංශෝධනයකර බදු අයකර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ගිවිසුමේ ඇතුළත් කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සහ එහි වතුයායන්වල භාවිතා කරන වාහන 06ක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වුවද එම වාහන ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම වාහන අතරින් වාහන 02ක් 2024 වර්ෂයේ මැයි මාසයේ සිට අළුත්වැඩියා සඳහා ගරාජයක රඳවා තිබුණි.	ජනවසම හා රාජ්‍ය වැවිලි සංස්ථාව එකම කළමනාකාරිත්වයෙන් තිබූ යුගයේ මෙම වාහන මණ්ඩලයත් වැවිලි සංස්ථාවත් භාවිතා කර ඇත.වාහන පවරා ගැනීම සඳහා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් 2023 වසරේදී ලිඛිතව ඉල්ලීම් කළද මේ දක්වා ප්‍රතිචාර ලැබී නොමැත. රාජ්‍ය වැවිලි සංස්ථාවේ අයිතිය ඇති වාහන 06 පමණක් මණ්ඩලය විසින් භාවිතා කරනු ඇත.	මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන වෙනත් ආයතනවලට අයිති වාහන පවරා ගැනීමට නොපමාව කටයුතු කළ යුතු අතර එම වාහන ඵලදායි ලෙස යෙදවීමටද අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	මණ්ඩලයට අයත් වතුයායන් 17හි පවතින පාලන දුර්වලතාවයන්, මණ්ඩලයට අවාසි සහගත වන ආකාරයට ගිවිසුම් ගතවීම,වර්තමාන තක්සේරු වටිනාකමට වත්කම් කුලීපදනම මත ලබා නොදීම,ආදායම් යාවත්කාලීනව එකතු කිරීමේ දුර්වලතාවයන් හා වැරදි ගෙවීම් ආදී අක්‍රමිකතාවයන් ඇතුළුව එම වතු මනා කළමණාකරණයෙන් තොරවීම,	වතුයායන් මගින් නිවැරදිව නියමිත කෘෂිකාර්මික ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම, තේ දළු සඳහා අවම මිලක් ලැබීම, කර්මාන්තශාලාවල යන්ත්‍ර සූත්‍ර අවුරුදු 100කට වඩා ඉපැරණි වීම වැනි සාධක මත අලාභ ඇතිවී ඇත. 2020 සිට 2023 දක්වා කාලය තුල දළු ආදායම ප්‍රධාන ලෙසම අඩුවූයේ රසායනික පොහොර භාවිතය නැවැත්වීම මගින්	නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් අනුගමනය කරමින් මනා කළමනාකරණයකින් යුතුව නිශ්පාදන පිරිවැය අවම මට්ටමකින් පවත්වා ගැනීමට හා දළු

	පැරණි යන්ත්‍ර සූත්‍ර භාවිතය, සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ පවතින දුර්වලතාවයන් මත දීර්ඝකාලීනව අලාභ ලබන තත්ත්වයක් පැවතුන අතර වතුයායන් 17 හි වසර 06 ක අලාභය රු.මිලියන 80ත් 540ත් අතර විය.	අමුදලු එලදාව අඩුවීමයි.වතු කාර්ය මණ්ඩල වැටුප් 25% බැගින් වැඩිවීම මගින් ඊට සාපේක්ෂව නිමි තේවල මිලට වඩා නිශ්පාදන පිරිවැය ඉහල යාම හා කම්කරු සේවක වැටුප රු.500 සිට 1000 දක්වා වැඩිවීම, මීට අදාලව පාරිතෝෂික හා ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම්වල අගය හා පාරිතෝෂික වෙන්කිරීමේ අගය ඉහලයාම යන කරුණු පදනම් කර ගෙන අලාභදායී තත්වයක් ඇතිවී ඇත.	ආදායම ඉහල නංවා ගැනීමට නොපමාව පියවර ගතයුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 හි 12 ඡේදය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් මූලික හඳුනා ගැනීමේදී සහ සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විකුණුම් සඳහා වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකමට මැනිය යුතු වුවත්, දැව වගාවේ වටිනාකම එලෙස තක්සේරු කර ලේඛනගත කර නොතිබුණි.	වාණිජමය දැව වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයෙන් තක්සේරු ලබාගෙන එය හෙළි දරව් කිරීම සිදු කිරීමට නියමිතයි . ගස් විකිණීමේදී හෝ ඉවත් කිරීමේදී ඒ සඳහා කරන ලද විකිණුම් පිරිවැය ගස් විකිණුම් අදායමෙන් අඩුකර පෙන්වීම වර්තමානයේ සිදු කරණු ලබයි.ජීව විද්‍යාත්මක වත්කම් (දැව ගස්වල) වල තක්සේරු වටිනාකම 2024 වර්ෂයේදි නිවැරදිව ගිණුම් වලට ගැලපිම සිදුකරන බව 2021 වර්ෂයේද මූල්‍ය ප්‍රකාශනය 5.5 සටහන් යටතේ හෙලිදරවු කර ඇති අතර, ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත. මෙම අගයන් වතුයායන්හි ගිණුම්වල නිවැරදි කර ගැලපිම සිදුකළ යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය බැවින් මෙලෙස 2024 වර්ෂයට ගැලපිමට කටයුතු කරනු ඇත.2023 දෙසැම්බර් මස දක්වා වාණිජමය දැව විකුණුම් ආදායම රු: මිලියන 356.97ක් වී ඇත.	ජීව විද්‍යාත්මක වත්කම් නිවැරදිව තක්සේරුකර ලේඛනගත කළ යුතුය.
(ආ)	2021 අගෝස්තු 27 දින සාමාන්‍යාධිකාරිවරයා විසින් අමු තේ දළු මිල සියයට 5 කින් අඩු කරන බවත් අඩුකිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව හා සැප්තැම්බර් මාසයේදී එම මිල සංශෝධනය මත තේ දළු ලබා දීමට කටයුතු කරන බව දන්වා පෞද්ගලික ආයතනයක සාමාන්‍යාධිකාරිවරයකු වෙත ලිපියක් යවා තිබුණද මිල සංශෝධනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලැබී නොතිබුණු අතර, සාමාන්‍යාධිකාරිවරයාගේ එම තීරණය මත	2021.8.27 දිනැති වැ.බ. සාමාන්‍යාධිකාරීගේ ලිපිය මගින් හැටන් වැවිලි සමගම වෙත 2021 සැප්තැම්බර් මාසයේ දළු සඳහා 5% ක මෙම මිළ අඩු කිරීම සඳහා එකී ලිපියේ 2021.08.26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව සටහන් කර තිබුනත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලැබී නොමැත.	නිසි අනුමැතියකින් පමණක් තේදළු මිල අඩුකිරීමට කටයුතු කළ යුතු අතර විධිමත් අනුමැතියකින් තොරව සිදුවූ ගණුදෙනු විලින් මණ්ඩලයට සිදුවූ අලාභය අයකර ගැනීමට නොපමාව පියවර ගතයුතුය.

	මිල සංශෝධනය කිරීම හේතුවෙන් මණ්ඩලයට රු.1,093,049 ක අලාභයක් සිදුවී තිබුණි.		
(ඇ)	ඇල්කඩුව වැවිලි සමාගම වෙත මණ්ඩලය විසින් 2012 අප්‍රේල් මාසයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා බදු කුලී අය කර ගැනීම සඳහා මණ්ඩලයේ ඉඩම් අංශය මගින් ඉන්වොයිස් හා ලිපි නිකුත් කර තිබුණද, ඒ අනුව 2022 ජනවාරි 31 දින වන විට එලෙස හිඟ හිටි බදු මුදල බදු ඉඩම් අංශය අනුව රු.23,292,240 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි බදු මුදල ගිණුම් අංශයට අනුව රු.8,723,921 ක් වී තිබුණි.මණ්ඩලය විසින් හිඟ හිටි බදු මුදල් නිවැරදිව හඳුනාගෙන ලේඛනගතකර නොතිබුණු අතර 2020 ජුනි 20 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් බදු දේපල පිලිබඳ වාර්තාවක් ලබා ගෙන ඇතත් සමාගම සමග නව බදු ගිවිසුමකට එළඹීමටද 2023 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය අපොහොසත්වී තිබුණි.	ඇල්කඩුව වැවිලි සමාගම නමින් ගිණුම් අංශයේ පවතින ලැබිය යුතු 8,723,921/- ක ශේෂය ඇල්කඩුව ආයතනය ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ රැදී සිටින කාලය තුල ගෙවිය යුතු ගොඩනැගිලි කුලී හා එම වකවානුවේ ජනතා වතු සංවර්ධන මණ්ඩල සේවකයන් ඇල්කඩුව වැවිලි සමාගම වෙනුවෙන් රාජකාරි කිරීම වෙනුවෙන් ලැබිය යුතු වේතන වලින් සමන්විත වේ. 2012.05.01 දින සිට ඇල්කඩුව වැවිලි සමාගම 320 ඩාර්ලි පාර වර්ග අඩි 3182 ක් පරිහරණය කලද බදු මුදල් ගෙවීමක් සිදු කර නොමැත. රු. 23,292,940/-ක ශේෂය 2022.01.31 ලැබිය යුතු බදු මුදල් වන අතර රු. 23,292,940/-ක මුදල අපගේ ගිණුම්වල සටහන්වී නොමැත.	හිඟ බදු මුදල් නිවැරදිව ගිණුම්ගත කර කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු අතර නව තක්සේරු අගයන් මත බදු ගිවිසුම් සංශෝධනයට කටයුතු කළ යුතුය.
(ඇ)	පුද්ගලික සමාගමක් වෙත මණ්ඩලයේ ඒ,ඩී සහ ඊ,එෆ් ගබඩා 2019 පෙබරවාරි 27 සිට 2023 පෙබරවාරි 26 දක්වා වූ වසර 04 ක කාලයක් සඳහා මාසික බදු පදනම යටතේ බදු දී ඇති අතර පැවති බදු ගිවිසුම අනුව පිළිවෙලින් වර්ග අඩි 13, 760ක් හා 10,089 ක් වූ මෙම ගබඩා, වර්ග අඩියකට මසකට රු.27.50 බැගින්, මුළු බදු මුදල රු.31,480,680 ක් වන වටිනාකමකට සහ මාසික බදු මුදල රු.378,400 ක් හා 277,447ක් වන ලෙස බදු ගිවිසුමකට එළඹී තිබුණි. මෙම බදු ගිවිසුමේ 1.(vii) උපවගන්තිය ප්‍රකාරව බදු මුදල සංශෝධනය කිරීමට හැකියාව ඇති බැවින් 2020 ජුනි 02 වන දින නව තක්සේරු වාර්තාවක් ලබා ගෙන පුද්ගලික සමාගම වෙත ඉදිරිපත් කලද නව තක්සේරුව අනුව බදු මුදල් ගෙවීම එම සමාගම ප්‍රතික්ෂේප කරමින් අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමු වී තිබුණි. එමෙන්ම මුල් බදු මුදල ගෙවීමද නියමිත පරිදි සිදු නොවන බැවින්, 2021 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු මුළු බදු මුදල රු.12,457,893 ක් වී ඇති බවත්, 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම් අංශයට අනුව එය රු.4,751,820ක් වන බවත් ඉඩම්	පුද්ගලික ආයතනයේ ගිණුම 2024.07.31 දිනට ඉඩම් අංශය හා සංසන්දනය කර, නිවැරදි කිරීම සිදුකර ඇති අතර, ඒ අනුව 2024.07.31 දිනට මිස්ටර් ජේන්ට් ආයතනයෙන් ලැබිය යුතු ශේෂය රු. 4,617,227.50ක මුදල් ගිණුම් අංශයේ හා ඉඩම් අංශයේ අගය හා සමාන වේ. කෙසේ නමුත් 2023.12.31 දිනට ගිණුම් අංශයට අනුව ශේෂය රු. 4,751,820/-ක් බැවින් ගිණුම් ත්‍රිත්වයම මේ වන විට ගලපා ඇත.	තක්සේරු අගයක් මත බදු ගිවිසුම් සංශෝධනය කර හිඟ බදු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.

	අංශයට අනුව එය රු.4,485,000ක් වන බවත් විගණනයට නිරීක්ෂණය විය.		
(ඉ)	හන්තාන උඩුවෙළ ධාරිතාවය තේ කි.ග්‍රෑම් 13,500ක් වූ තේ කර්මාන්ත ශාලාව අශෝක් ජපන් (පුද්ගලික) සමාගම වෙත ගිවිසුම් අංක 01 යටතේ 2021.06.29 දින සිට 2051.06.28 දක්වා වසර 30කට රු.6,240,000ක වාර්ෂික බදු කුළියකට බදු දී ඇති අතර 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ හිඟ බදු කුළිය රු.17,960,000ක් විය. එමෙන්ම බදු ගිවිසුමේ 7.(ඩී) උපවගන්තියේ පරිදි මාස දෙකක කාලයක් සඳහා බදු ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් බදු හිමියා ඉල්ලා සිටියත් නැතත් බදුකරු විසින් 5% ක ප්‍රමාද ගාස්තුවක් ගෙවිය යුතු වුවත් එවැනි කිසිදු ගෙවීමක්ද 2023 දෙසැම්බර් 31 දින දක්වාම සිදුව නොමැති බවත් බදු ගැණුම්කරු විසින් අදාල කර්මාන්තශාලාවේ කටයුතු ආරම්භ කර නොමැති බවත් විගණනයට නිරීක්ෂණය විය.	2024/12/31 දිනට පෙර සියලු හිඟ බදු මුදල් නොගෙවන්නේ නම් උඩුවෙල කර්මාන්තශාලාව නැවත ජනවසම වෙත පවරා ගන්නා බව බදුකරුට දැනුම් දී ඇත. ඒ අනුව 2024.12.09 දින තේ කර්මාන්තශාලාව නැවත ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත භාර ගැනීමටත් හිඟ බදු මුදල් අය කර ගැනීම සඳහාත් නෛතික කටයුතු සිදු කරනු ඇත.	හිඟ බදු කුලී හා ප්‍රමාද ගාස්තු කඩිනමින් අයකර ගත යුතු අතර ගිවිසුම ප්‍රකාරව පවරාගැනීමේ කටයුතුද නොපමාව සිදුකළ යුතුය.
(ඊ)	ශ්‍රේට්වැලි වත්තෙහි පිහිටි හෙක්ටයාර් 20.5 ක ඉඩම 2012 සැප්තැම්බර් 12 දින සිට 2042 සැප්තැම්බර් 18 දක්වා වූ වර්ෂ 30 ක කාලයක් සඳහා පුද්ගලික සමාගමක් වෙත රු.840,000 ක වාර්ෂික බදු කුළියකට ලබා දී තිබුණි. 2015 වර්ෂයෙන් පසුව සමාගම විසින් බදු ගෙවීම් සිදු කර නොතිබුණු අතර බදු ගිවිසුමේ අංක 06 වගන්තියේ iii වන උප වගන්තිය ප්‍රකාරව බදු මුදල් නොගෙවීම මත දේපල පවරා ගැනීමට ජනවසමට හැකියාව පැවතියද මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.එසේම 2023 දෙසැම්බර් 31 දින වන විට හිඟ බදු මුදල ඉඩම් අංශයට අනුව රු.10,855,404ක් වුවද 2014 අගෝස්තු 23 දින මෙම සමාගම ඈවර කර ඇති බව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණි.	ඉඩම් අංශය අනුව 2022/2023 වාර්ෂික බදු කුලියද ඇතුලත්ව හිඟ මුදල රු.10,855,404/-කි. 2023/2024 වර්ෂය අවසානයේදී රු.12,745,404/- කි.මෙම බදු ගිවිසුම සම්බන්ධයෙන් නඩු කිහිපයක් විභාග වෙමින් පවතින අතර, සමාගම වෙනුවෙන් නියෝජිතයින් සහභාගි වනු ඇත.	හිඟ බදු මුදල් අයකර ගැනීමට හා බදු නොගෙවීම් මත දේපල පවරා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.
(උ)	ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් නො 55/75 ,වොක්ෂොල් පටුමඟ,කොළඹ 02 හි පිහිටි වර්ග අඩි 6,959 ක කාර්යාල පරිශ්‍රය විශේෂ කාර්ය බලකාය (STF) නේවාසික පහසුකම් සඳහා 2020 අගෝස්තු 21 දින සිට වසර 2 1/2 ක කාලයක් දක්වා වර්ග අඩියක් රු.64.66 බැගින් වන පරිදි මාසිකව රු.450,000 ක මුදලකට බදු	ඉඩම් අංශයට අනුව රු. 2,100,000/-ක අයවිය යුතු ශේෂය ගිණුම් අංශයේ නොමැති බව සඳහන් කර ඇත. ඒ අනුව ගිණුම් අංශයේ විශේෂ කාර්ය බලකායට අයත් ගිණුම සත්තේක්ෂණය කිරිමට කටයුතු කර ශේෂය පිළිබඳ නැවත පරික්ෂා කිරිමට කටයුතු කරනු ඇත.	හිඟ බදු මුදල අයකර ගැනීමට හා අයවිය යුතු ශේෂය සම්බන්ධයෙන් ගිණුම් සැසදීම් සිදු කර නිවැරදි වටිනාකම හදුනා ගැනීමට කටයුතු කළ යුතුය.

	ගිවිසුම් අංක 05 යටතේ බදු පදනම මත ලබා දී ගිවිසුමට අදාළව බදු මුදල් අයකිරීම 2020 ඔක්තෝබර් 21 දින සිට බලාත්මක වුවද 2021 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු බදු කුලියක් මෙම බදු ගැණුම්කරුවන්ගෙන් අයකර ගෙන නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම හිඟ බදු මුදල ඉඩම් අංශයට අනුව එය රු. 2,100,000 වන බවත්, ගිණුම් අංශයට අනුව එවැනි මුදලක් අයවීමට නොමැති බවත් නිරීක්ෂණය විය.		
(ඌ)	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්හට නේවාසික පහසුකම් ලබාදීම සඳහා 2021 අගෝස්තු 01 සිට 2022 ජූලි 30 දක්වා වූ වසරක කාලසීමාවක් සඳහා බදු ගිවිසුමක් අත්සන් කිරීමට එකඟතාවයකට පැමිණ ඒ සඳහා 2021 අප්‍රේල් 22 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මෙම ගොඩනැඟිල්ලේ බිම් මහල රු.1,240,000 කට, දෙවන මහල රු.535,000 කට සහ ගොඩනැඟිල්ලේ උඩු මහල රු.200,000 කට තක්සේරු කර තිබුණි. ඒ අනුව 2021 අගෝස්තු 01 දින සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් මෙම ගොඩනැඟිල්ලේ නේවාසිකව සිටියද 2023 දෙසැම්බර් 31 දින දක්වා බදු මුදල් අයකර ගෙන නොතිබුණි. ඒ අනුව හිඟ බදු මුදල ගිණුම් අංශයට අනුව රු.7,065,711 ක් වන බවත් ඉඩම් අංශයට අනුව එය රු.4,330,000ක් වන බවත් විගණනයට නිරීක්ෂණය විය.	රු. 4,330,000/- මේ වන විට ගෙවා අවසන් කර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් 2023.12.31 දිනය ජනවසම වෙත අයවිය යුතු මුදල ඉඩම් අංශයට අනුව රු. 4,330,000/-ක් හා ගිණුම් අංශයට අනුව රු. 7,065,711/- ලෙස ඔබ විමසුමෙහි සඳහන් කර ඇත. ඒ අනුව අංශ දෙක තුළ ශේෂයෙහි වෙනසක් පවතින බැවින් ගිණුම් අංශයේ ශේෂය නැවත සත්තේක්ෂණය කිරිමට කටයුතු කරනු ඇත.	හිඟ ගොඩනැගිලි කුලී තහවුරු කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(එ)	ටී.බී.ජයා මාවතේ පිහිටි ගොඩනැගිල්ල සහ අක්කර 01 රූඩ් 02 පර්චස් 24 ක ඉඩම් ප්‍රමාණයක් 2007 දෙසැම්බර් 28 දින සිට 2060 දෙසැම්බර් 17 දින දක්වා වසර 53 ක කාලසීමාවකට පෞද්ගලික ආයතනයක් වෙත බදු දී ඇති අතර සම්පූර්ණ බදු මුදල රු.822,487,500 කි. ඒ අනුව එම සමාගම 2020 වර්ෂය වන විට මණ්ඩලයට ගෙවිය යුතු බදු මුදල රු.240,000,000 ක් වූ අතර එයින් රු.187,521,881 ක් ගෙවීම් කර ඇති බව සහ 2020 දෙසැම්බර් 31 දිනට හිඟ බදු මුදල රු.52,478,119 ක් වී තිබුණි.කෙසේ වුවද 2021 දෙසැම්බර් 31 දින වන විට රු.28,000,000 ක බදු කපා හැරීමක් සිදුකර ඇතත් එයට අදාලව ලබාගත් අධ්‍යක්ෂ	2023 දෙසැම්බර් 31 දිනට රු. 49,000,000/- ක මුදලක් හිඟව ඇත. ඉන් මිලියන 8ක් ගෙවා ඇති අතර, බදු මුදල් වාරික වශයෙන් ගෙවමින් පවතී. ආයතනය ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමග ඇති කරගත් බදු ගිවිසුම අනුව වරිපනම් බදු ඔවුන් විසින් නගර සභාව වෙත ගෙවිය යුතු වේ. ඔවුන් විසින් ගෙවිය යුතු වරිපනම් මුදල නගර සභාව වෙත ගෙවීම් සිදුකර අප වෙත ලදුපත ඉදිරිපත් කරන තෙක්, එය ඔවුන්ගෙන් ලැබිය යුතු මුදලක් ලෙස අප විසින් මෙම බදුකරුගේ බදු ගිණුම තුලින් පෙන්වා ඇත. බදුකරු විසින් එම වරිපනම් බදු ගෙවීම් කර අප වෙත ලදුපත ඉදිරිපත් කළ පසු එම	හිඟ ශේෂ අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතු අතර විධිමත් අනුමැතීන් මත පමණක් හිඟ බදු මුදල් කපා හැරීමට පියවර ගත යුතුය.

	මණ්ඩල අනුමැතිය ඇතුළු විධිමත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවූ අතර 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බදු කුළිය ගිණුම් අංශයට අනුව රු.22,018,383 ක් වන බවත් ඉඩම් අංශයට අනුව එම ආයතනයෙන් කිසිදු මුදලක් අයවීමට නොමැති බවත් විගණනයට නිරීක්ෂණය විය.	අගයන්ද මෙම ගිණුම තුල ඇතුලත් කර ඇති බැවින් 2023.12.31 දිනට රු. 22,018,383/- ශේෂය පෙන්නුම් කර ඇති අතර, ඉදිරියේදි වරිපනම් ගාස්තු ගැලපීම මෙම ගිණුමෙන් ඉවත් කර බදුකරුගෙන් ලැබිය යුතු බදු මුදල් පමණක් ගිණුම තුල පවත්වාගෙන යාමට කටයුතු කරනු ඇත.	
(ඒ)	හන්තාන වතුයායට අයත් අක්කර 01 පර්චස් 1.3ක පිහිටි තේ කර්මාන්තශාලාව හා ඉඩම 2001 ජනවාරි මස 01 දින සිට වර්ෂ 30 ක් දක්වා 1236 දරන බදු ගිවිසුමට අනුව මූලික වාර්ෂික බදු මුදල රු. 150,000 ක් යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට බදු දී තිබුණි. 2001 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු. 31,500,000 ක බදු මුදලක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් අයවිය යුතු වුවද 2003 වර්ෂයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් සේවක වැටුප් ගෙවීම සඳහා රු.25,000,000 මුදලක් තාවකාලික ණය මුදලක් ලෙස තේ මණ්ඩලයෙන් ලබා ගෙන ඇති බැවින් ඒ සඳහා පොලී මුදල් ද සමඟ රු. මිලියන 114 ක් ගෙවිය යුතු බවත්, මෙම ණය මුදල සහ මේ වන විට එකතු වී ඇති පොලියට හිලව්වන ලෙස උක්ත ඉඩම තේ මණ්ඩලයට පවරා දීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල අංක ජනවසම/ඉඩම/2020/2/12 හා 2020 පෙබරවාරි 27 මඟින් එකඟ වී තිබුනද. විධිමත් ලෙස ඉඩම් පැවරීමේ කටයුතු හෝ බදු මුදල් අයකර ගැනීමේ කටයුතු 2024 දෙසැම්බර් 31 දක්වා සිදුවී නොතිබුණි.	ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නීති නිලධාරි, ජනවසම නීති නිලධාරිනී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇත. මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරමින් පවතී. කෙසේ නමුත් එම කර්මාන්තශාලාව ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත මේ වන විටත් පවරා දී නොමැත.	අයවි යුතු හා ගෙවිය යුතු ශේෂ පියවීම හෝ තේ මණ්ඩලය වෙත අදාල ඉඩම පැවරීම තුලින් ණය හා බදු කුලී ගනු දෙනු නිරවුල් කරගැනීමට නොපමාව කටයුතු කලයුතුය.
(ඔ)	මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලක් උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙත බදු පදනමින් ලබා දී 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අයවීමට ඇති රු.112,160,392 කින් රු.94,982,553 ක් ලැබී තිබුණු බවත්, අළුත්වැඩියා ගාස්තුවක් ලෙස රු.1,030,400 ක් හා හලාවත වැවිලි සමාගමට රු.7,368,458 ක් බැගින් ලැබිය යුතු මුදලින් අඩුකර 2023 දෙසැම්බර් 31 දිනට රු.8,779,000 ක් අයවීමට ඇති බව විගණනයට වාර්තා කර තිබුණද මෙම ගනුදෙනු සම්බන්ධයෙන් විධිමත් ලිපි ලේඛන හා වාර්තා විගණනයට ඉදිරිපත් නොවූ අතර අයවීමට ඇති මුදල කඩිනමින් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.	ජනවසම සහ උසස් අධ්‍යාපන තාක්ෂණ ආයතනය අතර, ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවින් නව බදු ගිවිසුමක් සඳහා කෙටුම්පත් සකස් කර ඇත. එම මුදල් ගෙවීමක් නොකරනු ලබන්නේ ගිවිසුම් නොමැති බැවිනි. දන්වා ඇති ගණුදෙනු සම්බන්ධයෙන් විධිමත් ලිපි ලේඛණ සහ වාර්තා ලිපි ගොණුවේ ඇත. බදු මුදල් අය කර ගැනීම සඳහා පොලීසියට පැමිණිල්ලක්ද කර ඇත. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා වැවිලි හා ප්‍රජා යටිතල අමාත්‍යාංශයේ ලේකම්වරුන්ගේ සාකච්ඡාවක් මත ගෙවීමට අවස්ථාවක් ලබා දෙන බවට එම පාර්ශවය දන්වා ඇත.	අයවීමට ඇති හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඕ)	මණ්ඩලය විසින් 2020 වර්ෂයේ සිට කොම්පෝස්ට් සැකසීම,කෝපි වගාව,පොල්,පුවක්, සහ එළවලු වගාවන් යනාදිය සිදු කිරීම සඳහා වූ විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදීගැනීම වෙනුවෙන් රු.32,109,795 ක් වැයකර තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට එම ව්‍යාපෘතියෙන් ලද ආදායම රු.5,629,070 ක් පමණක් වන අතර ශක්‍යතා අධ්‍යනයකින් තොරව ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය වර්තමානයේදී සම්පූර්ණයෙන්ම නවතා දමා තිබූ බැවින් ඒ වෙනුවෙන් මණ්ඩලයට රු.26,480,725 ක පාඩුවක් දැරීමට සිදුවී තිබුණි.	මණ්ඩලය විසින් වතුයායන් 17ට කොම්පෝස්ට් පොහොර විශේෂ ව්‍යාපෘතියක් ලෙස දියත්කර ඇති අතර එම පොහොර විකිණීම සඳහා රු.මිලියන 32,109,795ක බැගින් ලබාගෙන ඇත. කෙසේ වෙතත් එම ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති අතර මෙය නිශ්කාර්ය වියදමකි. පොහොර ප්‍රමාණය වතුයායන්වල තේ කොටස් සඳහා දැමීමට මණ්ඩලය කටයුතු කර ඇත.	විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිසි සැලසුමකින් හා අධ්‍යනයකින් ක්‍රියාත්මක කළ යුතුය. මණ්ලයට සිදු වූ අලාභය සම්බන්ධයෙන් මු.රෙ.135 ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ක)	මණ්ඩලයට අයත් ඉඩම්,ගොඩනැගිලි සහ දේපළ කුලී පදනම මත බාහිර පාර්ශවයන් වෙත පැවරීමේ දී ඇතිකරගන්නා ගිවිසුම් සඳහා සියයට 1ක නීතිඥ ගාස්තුවක් අයකරන අතර එම ගාස්තුවෙන් සියයට 50 ක් මණ්ඩලය වෙතද,සියයට 30 ක් කළමනාකරු නීති හා නීති උපදේශක වෙතද,එක්සත් සුභසාධක අරමුදලට හා බෞද්ධ අරමුදලටද සියයට 10 බැගින් ද ගෙවීම් කර තිබුණි.ඒ අනුව 2022 හා 2023 වර්ෂයන්හි ගිවිසුම් අනුව මණ්ඩලයට ලද නීතිඥ ගාස්තුව රු.16,587,095 ක් වූ අතර එම මුදලින් රු.4,036,335 ක් කළමනාකරු (නීති) හා නීති උපදේශක වෙතද රු.1,691,052 ක් බැගින් එක්සත් සුභසාධක අරමුදලට හා බෞද්ධ සංගමය වෙතද ලබාදී තිබුණි. මණ්ඩලයේ වත්කම්වලින් උපයන ආදායම් මණ්ඩලයේ වැටුප් හා දීමනා ලබාගන්නා නිලධාරීන් කිහිපදෙනෙකු හා නීතිඥයින් වෙත සහ අරමුදල් දෙකකට බෙදාදීම සඳහා ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය විගණනයේදී ගැටළු සහගත වූ අතර මෙම ගෙවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. එමෙන්ම මණ්ඩලය විසින් සිදුකරන ලබන කාර්යයන් නීති,රීති,රෙගුලාසිවලට අනුකූලව සහ විධිමත්ව සිදුනොවීම හේතුවෙන් නිරන්තරයෙන්ම බාහිර පාර්ශවයන් විසින් මණ්ඩලයට විරුද්ධව හා මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන්ට විරුද්ධවද නඩු පැවරීම්	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම ගෙවීම් සිදු කර ඇත.	රජය සතු ව්‍යවස්ථාපිත මණ්ඩලයකට අදාල වියදම් භාණ්ඩාගාර නීතිරීති වලට අනුකූලව විධිමත් අනුමැතීන් මත පමණක් සිදුකල යුතුය.

	කටයුතු බහුලව සිදු වී ඇති අතර 2021,2022 හා 2023 වර්ෂයන්ට අදාලව පිළිවෙලින් රු.6,989,201ක්, රු.22,083,370ක් හා රු.17,786,692ක් ලෙස බාහිර පාර්ශවයන් වෙත නීතිඥ ගාස්තු ගෙවීම් කර තිබුණි.		
(ග)	මණ්ඩලය විසින් ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි පරිදි සිදු කර නොමැති බැවින් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල්, වතු කාර්යමණ්ඩල අර්ථ සාධක සංගමය,ලංකා වැවිලි කරුවන්ගේ අර්ථසාධක සංගමය සඳහා වන දායක මුදල් හා පාරිතෝෂික වටිනාකම රු.2,883,430,734 ක් වී තිබුණි	ආයතනයේ පැවති දැඩි කාරක ප්‍රාග්ධන මුල්‍ය හිඟය නිසා 2000 වර්ෂයේ පමණ සිට EPF/ETFදිගින් දිගටම ගෙවීමට නොහැකි වී තිබු අතර, මුදල් අමාත්‍යාංශයෙන් සමහර වර්ෂවල මෙම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීම සඳහා අරමුදල් ලබාදීඇත. ඒ අනුව එම මුදලින් ගෙවීම් සිදු කර ඇත. ඊට අමතරව 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0768/616/017 අනුව රු. මිලියන 30ක මුදලක් සෑම මසකම, මෙම හිඟ ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සඳහා ලබා දෙමින් පවතී. එමගින් හිග ව්‍යවස්ථාපිත දීමනා නැවත ගෙවීම් සිදුකරගෙන යමින් පවති. තවද 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක පනතට අනුව හා 1980 අංක 46 දරණ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් පනතට අනුව 2023 ජුලි මස සිට වර්තමාන ව්‍යවස්ථාපිත ගෙවීම් ආයතනයේ මුදලින් ක්‍රමානුකුලව ගෙවීම් කරනු ඇත.	ව්‍යවස්ථාපිත ගෙවීම් ක්‍රමාණුකූලව සිදුකිරීම තුලින් අනාර්ථික වියදම් වළක්වා ගැනීමට නොපමාව පියවරගත යුතුය.
(ච)	2020 දෙසැම්බර් 08 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික පිරිවැටුමෙන් සියයට 0.25ක් (භූමිය,ගොඩනැගිලි හා දැව ආදායම් හැර) යොදා "සභාපති සුභ සාධක අරමුදල" නමින් අරමුලක් පිහිටුවා තිබුණද අරමුදලේ කළමනාකරණ ක්‍රමවේදය හා නීති රීති ඇතුළත් කර ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතියද ලබාගෙන නොතිබුණි. මණ්ඩලය විසින් දිගින් දිගටම පාඩු ලබමින් පැවතුනද 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වා මෙම අරමුදල වෙත ප්‍රධාන කාර්යාලය හා වතුයායන් පිළිවෙලින් රු.3,935,284ක් හා 3,638,708 ක් බැර කර තිබුණු අතර මණ්ඩලයේ අරමුණු වලින් පරිබාහිරව හා අරමුදලක් පිහිටුවීම සඳහා ලබා ගතයුතු අනුමැතීන් වලින් තොරව පිහිටවූ මෙම අරමුදලින්, 2020 වර්ෂයේ සිට 2024 මැයි දක්වා රු.7,043,586 ක් ගෙවීම් කර තිබූ අතර මේ තුළ රු.220,000ක සංග්‍රහ	මෙම අරමුදල පිහිටුවීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදුකර ඇති අතර එම අධ්‍යක්ෂක මණ්ඩල තීරණයන් ගනු ලැබූ අධ්‍යක්ෂක මණ්ඩලය තුල ඊර්බිය අමාත්‍යාංශයේ හා මුදල් අමාත්‍යාංශයේ නියෝජනය සිදුවී තිබිණි. මෙම අරමුදලින් ගෙවීම් කටයුතු කිරීමද අදාල අනුමැතීන් ලබාගෙන සිදුකර ඇත.	භාණ්ඩාගාර නීති රීති වලට අනුකූලව විධිමත් අනුමැතීන් මත පමණක් අරමුදල් ඇතිකිරීම, අරමුදල සඳහා දායකත්වය ලබාගැනීම,වියදම් කිරීම සිදුකල යුතුය.

	වියදම්ද ඇතුළත් වී තිබුණි. මේ අනුව එම වියදම් සඳහා බලයදීම අනුමැතිය ලබාදීම සහතික කිරීම සහ ගෙවීම් සඳහා සම්බන්ධ වූ සියළු නිළධාරීන් මුදල් රෙගුලාසි 135 අනුව වගකිවයුතු බව විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.		
(ජ)	2007 වර්ෂයේදී නාගස්තැන්න වතුයාය දීර්ඝකාලීන බදු පදනම මත පෞද්ගලික සමාගමකට ලබාදීමෙන් පසු එම ආයතනයෙන් අය විය යුතු රු.2,176,683 ක් වර්ෂ 12 කට වැඩි කාලයක සිට වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුනද ඉඩම් අංශයෙන් ලද තොරතුරුවලට අනුව 2009 වර්ෂයේදී මණ්ඩලය විසින් එම වතුයාය නැවත පවරා ගැනිම හේතුවෙන් 2024 ජුනි 30 දිනට එම සමාගමට ගෙවිය යුතු මුදල රු.21,986,330 ක් වී තිබුණි.	නාගස්තැන්න වතුයාය පෞද්ගලික ආයතනයක් වෙත 2007 වර්ෂයේදි දිර්ඝකාලීන බදු පදනම මත ලබාදී ඇත. ඉඩම් අංශයෙන් ලද තොරතුරුවලට අනුව එම සමාගම හා ජනතා වතුසංවර්ධන මණ්ඩලය එකග වු පරිදි 2009.12.22 වන විට අප විසින් නාගස්තැන්න වතුයායේ නැවත පවරා ගැනිම හේතුවෙන් එම සමාගමට ගෙවිය යුතු වු මුදල රු. 24,551,713.66කි. එම එකගවීමෙන් අනතුරුව මණ්ඩලය විසින් රු. 1000,000/- මුදලක් එම ආයතනය වෙත ගෙවීම් කර ඇති අතර, ඊට අමතරව, නාගස්තැන්න වතුයායේ තේ දළු තැරැව්කරුවන්ට විකිණිමෙන් ලද මුදල් ඔවුන් විසින් ලබාගෙන ඇති අතර, එම මුදල අඩුකළ පසු ඔවුන් වෙත ගෙවිය යුතු මුළු මුදල රු. 21,986,330/-කි. එම සමාගමේ 2024.06.24 දිනැති ලිපියෙන් ඔවුන් වෙත ලැබිය යුතු ශේෂය රු. 21,986,330/- බව සනාථ කර ඇත.	දේපල බදු දීම තුළින් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් නොපමාව නිරවුල් කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසන් වන විට මණ්ඩලයේ තේ සහ රබර් වගා කරන ලද මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 286.88ක් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබුණද වර්තමානය වන විටත් එම ඉඩම් මණ්ඩලය වෙත පවරා ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	හුදෙක් අනවසර අත්පත්කර ගැනීම් වතුයායේ සේවය කර විශ්‍රාම ගිය සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල් සාමාජිකයින් විසින් සිදු කර ඇති අතර, ඔවුන්ට විරුද්ධව කටයුතු කිරීමේ යම් යම් බාධාවන් පවතින අතර, පිටස්තර පුද්ගලයින්ගේ අනවසර අත්පත් කර ගැනීම් සඳහා කටයුතු කර ඇත. කෙසේ වෙතත් වතු අධිකාරීන් මගින් මෙම අනවසර අත්පත් කර ගැනීම් සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පසුබිම සකසා ඇත.	මණ්ඩලය සතු වතුයායන් වල පදිංචි වී ඇති අනවසර පුද්ගලයන් සම්බන්ධ ගැටළුව විසදීමට විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	මණ්ඩලය සතු හෙක්ටයාර 1,951 ක හිස්/මුඩු ඉඩම් හා හෙක්ටයාර 1,288 ක කැලෑ ඉඩම් පවතින නමුත් එම ඉඩම් වගා කටයුතු සඳහා යොදා ගැනීමට මණ්ඩලය	2022 වසරට අනුව පෙන්නුම් කරන නොමේරූ තේ හා රබර් වගාවට අයිති ප්‍රමාණය හෙක්ටයාර 76.1 ක් වනු ඇත.	වගා නොකළ ඉඩම් වගා කටයුතු සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය.

කටයුතු කර නොතිබුණු අතර තේ වගාව සඳහා වෙන්කර ඇති භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 77.40 ක් ද මණ්ඩලය විසින් අත්හැර දමා තිබුණි.

(ඇ) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතුව තේ කම්හල් 15 ක් පවතින අතර, වර්තමානය වන විට කම්හල් 3ක් පමණක් ක්‍රියාකාරි තත්ත්වයේ පවතී. මෙම කම්හල් 03 නිමි තේ නිෂ්පාදනය සඳහා භාවිතාකරනු ලබන නමුත් මෙම කම්හල්වල ධාරිතාවය පරීක්ෂා කිරීමේදි මණ්ඩලය මගින් ක්‍රියාත්මක කම්හල් සඳහා නිමි තේ නිෂ්පාදනයට අවශ්‍ය අමු තේ දළු මණ්ඩලයේ වතු වලින් ලබා දීම ඉතාමත් දුර්වල තත්ත්වයක පවතින බවත් එනම් වර්ෂයකට දින දෙසීයයක් එක් කම්හලක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතීය යන්න උපකල්පනය කළ විට එක් කම්හලකට දිනකට ලැබෙන අමු තේ දළු ප්‍රමාණය කිලෝග්‍රෑම් 3,390 ක් පමණ බව නිරීක්ෂණය විය. එබැවින් කම්හල් ධාරිතාවයෙන් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් උපයෝජනය වන බැවින් ධාරිතාවය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග මණ්ඩලය විසින් ගෙන නොතිබුණි.

කර්මාන්තශාලා 03ක් ක්‍රියාකාරී මට්ටමේ තිබුණත් එම කර්මාන්තශාලාවල යන්ත්‍ර සූත්‍ර තාක්ෂණය යාවත්කාලීනව සිදු නොවන නිසා ඉහල ශුද්ධ විකුණුම් මිලක් ලැබෙන ගුණාත්මක තේ නිශ්පාදනයක් ලබාදීමට මණ්ඩලය අපොහොසත් වී ඇති අතර අඩු තේ මිලක් ලැබීම නිසා අනෙකුත් වතුයායන් වලින් මණ්ඩලයේ කර්මාන්තශාලාවලට දළු ලබාදීම තුලින් එකී වතුයායන් අලාභදායී තත්වයට වැඩි හැකියාව ඇති නිසා මණ්ඩලයේ කර්මාන්ශාලාවලට දළු ලබාදීම සිදු නොකරයි. වර්තමානයේ කර්මාන්තශාලා 03 ඇති වතුයායන් එම වතුයායේම දළු පමණක් නිශ්පාදන ක්‍රියාවලියට යොදවන අතර සාමාන්‍යයෙන් දින දෙකකට වරක් නිෂ්පාදන කටයුතු සිදුකරයි. අවධාරිතාව නිසා නිෂ්පාදන පොදු කාර්ය වියදම් වැඩිවී ඇත.

2022-2023 වසරවල දැඩි වූ මූල්‍ය අර්බුදය හා පොහොරමිල 300%කින් පමණ වැඩිවීම මත වතුයායන් වෙත පොහොර ලබා නොදීම නිසා දළු ප්‍රමාණය සාපේක්ෂව අඩුවීම හේතුවෙන් ද දෛනික නිෂ්පාදන ධාරිතාව අඩුවී ඇත.

මණ්ඩලය විසින් භාවිතා කරන ක්‍රියාකාරී තත්වයේ පවතින කර්මාන්තශාලා 3 උපරිම ධාරිතාවයෙන් යුතුව අළුත්වැඩියාවක් සිදු කරමින් භාවිත කළ යුතු අතර වතුයායන්වල එලදාව ඉහල නංවා ගැනීමටද පියවර ගත යුතුය.

3.4 කාර්යය මණ්ඩල පරිපාලනය

විගණන නිරීක්ෂණය

(අ) 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 II ඡේදයට අනුකූලව අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ පෞද්ගලික නිර්දේශය මත අත්‍යවශ්‍ය තනතුරු සඳහා පමණක් විශ්‍රාමික නිලධරයකු මාස 12ක උපරිමයකට යටත්ව අනුමත තනතුරක සේවයේ යෙදවිය හැකි වුවද 2021 පෙබරවාරි 01 දින සිට 2022 ජනවාරි 31 දින දක්වා රු. 55,000 ක දීමනාවක් සහ නිල නිවාසයක්ද ලබා දෙමින් සම්මුඛ පරීක්ෂණයකින් තොරව නිළධාරියෙකු සහකාර අභ්‍යන්තර විගණක තනතුරෙහි පිහිටුවා තිබුණි. එසේම අමාත්‍යාංශ

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම

මෙම සහකාර අභ්‍යන්තර විගණක මගින් ආයතනයේ සුවිශාල වැඩ කොටසක් සිදුකර ඇති අතර, වතු විගණක ක්ෂේත්‍රයේ අවුරුදු 30කට වැඩි අත්දැකීම් ඉහල අයෙකු වීම නිසා අභ්‍යන්තර පාලන පද්ධති,ගිණුම්කරන කටයුතු ,මෘදුකාංග යාවත්කාලීන කටයුතු සඳහා ඔහුගේ සහය නිරතුරුවම ලැබේ.තවද මෙ වන විටත් ආයතනයේ 60 ඉක්මවූ ව්‍යාපෘති නිළධාරියෙකු සේවයේ යෙදෙනු ඇත. තවද පත්වීම් ලිපියේ නිල නිවසක් ලබා දීම පිළිබඳ සටහන් නොවේ.

නිර්දේශය

මණ්ඩලයේ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට අනුමත රෙගුලාසි මත පමණක් බඳවා ගැනීම් සිදුකළ යුතුය.

	ලේකම්ගේ නිර්දේශයෙන් තොරව 2023 දෙසැම්බර් 31 දින වන විට වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් 10 දෙනෙකු මෙම නිලධාරියා ඇතුළුව සේවය කරන තිබූ අතර, ඔවුන් සඳහා 2023 වර්ෂයෙදී රු.1,397,148ක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.		
(ආ)	2017 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති නිළධාරියෙකු සම්මුඛ පරීක්ෂණයකින් තොරව 2020 ජුනි 01 දිනැති සභාපතිවරයාගේ ලිපිය ප්‍රකාරව වතු අංශයේ කළමණාකරු තනතුරට පත්කර රු.70,000 ක මාසික දීමනාවක් 2020 සැප්තැම්බර් මාසයේ සිට 2022 ඔක්තෝබර් මාසය දක්වා ගෙවීම් කර තිබුණි. එසේම 2022 ඔක්තෝබර් 17 දිනැති අංක JEDB/ES/EXPF/544 දරන සභාපතිවරයාගේ ලිපිය ප්‍රකාරව යථෝක්ත නිළධාරියා වතු අධිකාරී ලෙස උසස් කර තිබුණද බඳවාගැනීමේ පටිපාටිය අනුව එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්ද ඔහු විසින් සම්පූර්ණ කර නොතිබුණි.වතු අධිකාරී තනතුරට හිමි මූලික වැටුප රු.68,835 ක් වුවද රු.93,665 ක මූලික වැටුපක් සහිතව එම තනතුර ලබාදී තිබුණි.ඒ අනුව 2022 නොවැම්බර් මාසයේ සිට 2023 සැප්තැම්බර් මාසය දක්වා රු.1,039,148ක වැටුප් ගෙවා තිබුණි. එසේම 2020 සැප්තැම්බර් මාසයේ සිට 2023 දෙසැම්බර් මාසය දක්වා එම තනතුරට හිමි නොවන රු.50,000 බැගින් රු.1,991,167 ක වාහන දීමනාවක්ද රු.12,480 බැගින් රු.992,810ක ඉන්ධන දීමනාවක්ද ගෙවීම්කර තිබුණි.එසේම මෙම තනතුරට හිමිකම් නොමැති රු.5,000ක දුරකථන දීමනාවක්ද 2022 පෙබරවාරි සිට 2023 දෙසැම්බර් දක්වා එකතුව රු.100 ,000 ක් ගෙවීම් කර තිබුණි.	2017 වර්ෂයේදී අනුමත වූ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවක සැලැස්මට කළමණාකරු (වැවිලි) යන තනතුරු ඇතුලත්ව නොතිබීම නිසා 2020 වසරේ මැයි මස 12 වන දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි කළමණාකරු (වැවිලි) තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත එම නිලධාරියා බඳවා ගෙන ඇත. අදාල තනතුර සඳහා මූලික සුදුසුකම් සපුරා නොමැත.මෙම තනතුර සඳහා බඳවා ගැනීමට ප්‍රධාන වශයෙන් ඉවහල් වී තිබුනේ යෝජිත ව්‍යාපෘති ආශ්‍රිත රාජකාරීන් නිසි පරිදි ඉටු කිරීම සඳහා සේවයේ යොදවා ගැනීමට ආයතනය තුල සේවකයින් නොමැතිවීමත් යන කරුණු හේතුවෙනි.ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය ගෙන තිබූ තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් සිදුකර ඇත. මෙම නිලධාරියා වර්තමානයේ වතු අධිකාරී තනතුරට පත්කර ඇත. ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට අමාත්‍යාංශය මගින් දන්වන ලදී . එම දැන්වීම් වලට ලද ප්‍රතිචාරයන් ලෙස 2022.11.02 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාරතමේන්තුව විසින් ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත දන්වන ලද්දේ වතු අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම් සලකා බැලිය නොහැකි බව සඳහන් කරන ලදී.මණ්ඩලයේ කාර්යයන් කඩිනමින් ඉටු කර ගැනීම සඳහා වතු අධිකාරී තනතුරට බඳවා ගැනීම අත්‍යාවශ්‍ය වූ බැවින් මෙම බඳවා ගැනීම සිදු කර ඇත. 2022 නොවැම්බර් 08 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත බඳවා ගැනීම් සිදුකර ඇති අතර සුදුසුකම් සපුරා නොමැත.මෙම වැටුප් පරිමාණය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව 2022 වර්ෂයේදී ලබා දී ඇති අතර ඒ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.	කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබූ තනතුරු සඳහා අනුමත වැටුප් හා දීමනා මත පමණක් බඳවා ගැනීමේ පටිපාටිය අනුව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	2020 අගෝස්තු 26 දිනැති සභාපතිවරයාගේ ලිපිය ප්‍රකාරව යථොක්ත නිලධාරියා ඉහත තනතුරුවල සිටියදීම වැඩබලන සාමාන්‍යාධිකාරී ලෙස පත්කර තිබුණු නමුත් සාමාන්‍යාධිකාරී තනතුරට හිමි සුදුසුකම් ඔහු සතුව නොතිබුණි. 2023 අගෝස්තු මාසයේ සිට 2024 ජූලි මාසය දක්වා මෙම නිලධාරියාට මාසිකව රු.35,000 ක් බැගින් කම්කරු දීමනාවක් හා මාසිකව රු.30,000 බැගින් නිවාස කුළී දීමනාවක්ද ගෙවීම් කර තිබුණි.	සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පළකොට පුද්ගලයින් සම්මුඛ පරීක්ෂණය සඳහා ගෙන්වා ගත් අතර සුදුසුකම් සහිත පුද්ගලයින් නොමැති වීම නිසා අදාල තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට නොහැකි විය. එම නිසා සුදුසුකම් සැලකිල්ලෙන් තොරව සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගෙන ඇත. ඒ අනුව අදාල බඳවාගත් නිලධාරීට සාමාන්‍යාමිකාරී තනතුර සඳහා සුදුසුකම් තිබී නොමැත.2023 ජූලි මස සිට 2024 මාර්තු මස දක්වා වැ.බ. සාමාන්‍යාධිකාරී දීමනාව ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් නොමැති අතර එය අනුමැතියකින් තොරව ගෙවා ඇත.කම්කරු දීමනා හා නිවාස කුලී දීමනාව එවකට සිටි සභාපතිතුමාගේ අනුමැතිය මත අධ්‍යක්ෂ මණ්ඩලයට පත්‍රිකා යොමු කොට අනුමැතිය ලබා ගෙන ගෙවීම් සිදු කොට ඇත.ඒ වනවිට හන්තාන වතුයාය මගින්ද මෙම නිලධාරියට වතු බංගලාවක් ලබාදී ඇත.	ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන වලට අනුකූල වන පරිදි වැඩබැලීමේ, පත්වීම් ලබාදීමට හා ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ සභාපතිගේ පුද්ගලික සහකාර නමින් වූ MM 1-1 වැටුප් කාණ්ඩය හා දීමනා සහිත තනතුරක වැඩ ආවරණය කිරීම සඳහා සභාපති අංශයේ රහස්‍ය ලේකම් JM 1-1 කාණ්ඩය) 2021 ඔක්තෝබර් 15 දින සිට බලපැවැත්වෙන පරිදි මණ්ඩලයේ සභාපතිවරයා විසින් පත්වීමක් ලබා දී තිබුණි. 2021 ඔක්තෝබර් 15 දින සිට 2023 දෙසැම්බර් මාසය දක්වා කාලය සඳහා වැටුප් , ඉන්ධන දීමනා, ප්‍රවාහන දීමනා හා විශේෂ දීමනා ඇතුළුව රු.4,501,905ක මුදලක් රහස්‍ය ලේකම් තනතුරෙහි සේවය කරන නිලධාරිනියට ගෙවීම් කර තිබුණු නමුත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 ජූනි 10 දිනැති DMS/1696/Vol – V අංක දරන ලිපියේ 04 ඡේදය අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලය සඳහා රහස්‍ය ලේකම් තනතුරක් හා ලේකම් තනතුරක් දැනටමත් අනුමත කර ඇති බැවින් සභාපතිගේ පෞද්ගලික සහකාර තනතුරක් ඇති කිරීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බව දන්වා තිබුණි. එමෙන්ම 2023 නොවැම්බර් 01 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම නිලධාරිනිය කළමනාකරු - පාරිභෝගික තනතුරට ස්ථිර	ආයතනයේ ලේකම් තනතුර සාමාන්‍යාධිකාරී අංශයට අනුයුක්තව සාමාන්‍යාධිකාරී අංශයෙහි රාජකාරි කටයුතු සිදු කරන අතර ආයතනයේ ඉහලම මට්ටමේ විධායක නිලධාරී ලෙස අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු හා ආයතනයේ අනෙකුත් අංශ අතර තොරතුරු සම්බන්ධීකරණය වැනි කටයුතු සාමාන්‍යාධිකාරී කාර්යාලයෙන් සිදු වන අතර අනුමත ලේකම් තනතුර සාමාන්‍යාධිකාරී අංශයට අනුයුක්තව ඇත. 2023 වසරේදී එවකට කළමණාකරු - පාරිභෝගික තනතුර දැරූ නිලධාරියා විශ්‍රාම ගිය බැවින් අදාල බඳවා ගැනීම අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර එහිදී අදාල තනතුර සඳහා JM 1-1 ශ්‍රේණියේ අභ්‍යන්තර නිලධාරියෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබිණ. අදාල ඉල්ලීම සම්බන්ධයෙන් වැවිලි අමාත්‍යාංශයේ මෙන්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය හිමිවිය. එබැවින් මේ සම්බන්ධව ආයතනයේ වෙබ් අඩවියේ ආයතන පරිශ්‍රයේද දැන්වීම් පළ කර සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එහිදී ලැබූ ලකුණු ප්‍රමාණයන්ද අධ්‍යක්ෂක මණ්ඩලයට අදාල තීරණ ඉදිරිපත් කිරිමෙන් පසු අධ්‍යක්ෂක මණ්ඩලය ද තීරණය අනුමත කර මෙම නිලධාරිනිය කළමණාකරු	කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබූ තනතුරු සඳහා අනුමත වැටුප් හා දීමනා මත පමණක් බඳවා ගැනීමේ පටිපාටිය අනුව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.

	පදනමින් පත් කිරීම සිදු කර තිබුණි. මෙම පත්වීම සඳහා අභ්‍යන්තර අයදුම්කරුවෙකු විසින් කනිෂ්ඨ කළමනාකරණ (JM) සේවා ගණයෙහි අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම අවම සුදුසුකම වුවද එම සුදුසුකම් නිළධාරිනිය සතු නොවීය. මෙම පත්වීම සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීමට කැමැත්තක් දක්වන සියලු නිලධාරීන්ගේ දැන ගැනීමට හැකිවන පරිදි දැන්වීම් ප්‍රසිද්ධකර නොතිබුණු නමුත් අයදුම්කරුවන් දෙදෙනෙකු මෙම තනතුර සඳහා අයදුම්කර තිබුණි.එහිදී සුදුසුකම් ලබාසිටි අයදුම්කරු වෙත ලකුණු ලබා නොදී මෙම අයදුම් කාරිනිය වෙත ඉහල ලකුණු ලබාදෙමින් පත්වීම එම නිළධාරිනිය වෙත පිරිනමා තිබුණි.	(පාරිභෝගික) තනතුරට 2023.11.01 දින සිට පත් කර ඇත.	
(ඉ)	මණ්ඩලයේ පුරප්පාඩු වූ සාමාන්‍යාධිකාරී , කළමනාකරු වැවිලි , පරිපාලන නිළධාරී , කළමනාකරු සැලසුම්,පර්යේෂණ හා සංවර්ධන සහ සහකාර අභ්‍යන්තර විගණක යන තනතුරු මණ්ඩලයේ එදිනෙදා රාජකාරි ඉටුකිරීම සඳහා අත්‍යාවශ්‍ය වුවද එම තනතුරු සඳහා නිළධාරීන් බඳවා ගැනීමේ අවශ්‍යතාව හඳුනාගෙන තනතුරු පිරවීමට කටයුතු නොකර වරින් වර එම තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම සහ වැඩ ආවරණය කිරීමේ පදනම මත නිළධාරීන් බඳවාගෙන තිබූ බැවින්, මණ්ඩලයේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට සහ මෙහෙයුම් ක්‍රියාවලියට එය සෘජුවම අහිතකර ලෙස බලපා තිබුණි.	ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එම අමාත්‍යාංශය විසින් මෙම ඉල්ලීම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.සාමාන්‍යාධිකාරී තනතුරට අනුමැතිය 2023 වර්ෂයේ ලැබුණු අතර අනෙකුත් තනතුරු බඳවා ගැනිම සඳහා බඳවා ගැනීම් අග්‍රාමාත්‍ය කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීමට සිදු විය. 2024.07.25 දින අග්‍රාමාත්‍ය කමිටුවේ අනුමැතිය ලැබිණි. ඒ අනුව අනුමැතිය ලැබුණු සාමාන්‍යාධිකාරී, කළමණාකරු (වැවිලි) සහකාර අභ්‍යන්තර විගණක තනතුර සඳහා පුවත්පත් දැන්වීම් පළ කොට ඉදිරි කටයුතු කිරීමට සූදානම් කර ඇත.	මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව ඉහල නංවා ගැනීමට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා අනුමත නීති රීති වලට අනුකූලව කාර්යමණ්ඩලය බඳවා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.